## ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය - 2015

ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංවිධානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංවිධානයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම (ශ්‍රී ලං රා ගි ප්‍ර 01)

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම (ශ්‍රී ලං රා ගි ප්‍ර 01)**
ප්‍රමිතියේ විධිවිධාන වලට අනුව, සෑම අංශයකම ආදායම සහ වියදම වෙනමම දැක්වීම වෙනුවට සංවිධානයේ අංශ 6 ක ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵලය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායම වශයෙන් පෙන්වා තිබුණි.

(ආ) **දේපල, පිරියත හා උපකරණ (ශ්‍රී ලං රා ගි ප්‍ර 07)**
ප්‍රමිතියේ විධිවිධාන වලට අනුව, දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය ප්‍රතිපාදනය එම වත්කම් මිලදී ගත් දිනය පදනම් කර ගෙන සිදුකළ යුතුය. කෙසේවෙතත්, සංවිධානයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, ක්ෂය සඳහා ප්‍රතිපාදනය එම වත්කම් මිලදී ගත් සම්පූර්ණ වර්ෂය සඳහා වෙන්කර තිබුණු අතර බැහැර කරන වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) සංවිධානයේ නව මූලස්ථානය සඳහා ඉදිකරන ලද ගොඩනැඟිල්ලේ කොන්ත්‍රාත් පිරිවැය ලෙස කොන්ත්‍රාත් වැඩ සඳහා සෘජුවම අදාල නොවූ එකතුව රු.මිලියන 1.44 ක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත සපයන ලද උපදේශක සේවාවන් මත ලැබී තිබුණු රු.මිලියන 1.66 ක ආදායම පරිසර අධ්‍යයන සහ සේවා අංශයේ ආදායම යටතේ දැක්වීම වෙනුවට ප්‍රධාන කාර්යාලයේ ආදායමක් ලෙස සාවද්‍ය ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරය එකගතාව සහිතව එකතුව රු.මිලියන 17.85 මුදලක් බොල් ණය ලෙස ලියා හැර තිබුණු අතර එය ප්‍රධාන කාර්යාලයේ වියදමක් ලෙස දැක්වීම වෙනුවට නාය යෑම් පර්යේෂණ අවදානම් කළමනාකරණ අංශයේ වියදමක් ලෙස දක්වා තිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

නායයෑම් අවධානම් අවමකරණය, උපදේශක වැඩ යනාදී මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා පිළියෙල කරන පිරිවැය ඇස්තමේන්තුවට ලාභ / පොදුකාර්ය

ආන්තිතයක් පරිවයන් ලෙස සංවිධානය විසින් ඇතුළත් කරනු ලබයි. කෙසේ වෙතත්, එක් එක් ව්‍යාපෘතියක් සඳහා අයකරන ලද ලාභ / පොදු කාර්ය ආන්තික පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පැහැදිළි කිරීම් අනුව, ආයතන විසින් අනුගමනය කරනු ලබන ස්ථාවර ගාස්තු අනුපාත පදනම් කර ගනිමින් ප්‍රමාණ ඇස්තමේන්තු, ටෙන්ඩර් ලියවිලි සකස් කිරීම හා ප්‍රදානය කිරීම, වැඩ අධීක්ෂණය, අනුකූලතා පරීක්ෂණ යනාදිය සඳහා වූ පොදු කාර්ය වියදම් තක්සේරු කරන අතර එම සංඛ්‍යාවන් අවදානම් අවම කරන කාර්යයේ ස්වභාවය අනුව තීරණය වේ.

## 2.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 4.1 වගන්තියට අනුව අතිකාල දීමනා අහිමි නිලධාරීන් 124 දෙනෙකුට එකතුව රු.මිලියන 3.99 ක අතිකාල දීමනා ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය. අධ්‍යක්ෂ ජනරාල්ගේ පැහැදිළි කිරීම අනුව, සංවිධානය ගොඩනැඟිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තාක්ෂණික උපදේශකයා වන අතර ගොඩනැඟිලි ද්‍රව්‍ය, වතුර, වාතය, පස සහ විශේෂයෙන් නායයෑම් පරීක්ෂා කිරීමේ ක්ෂේත්‍රවල විශේෂඥ දැනුම සහිත කාර්ය මණ්ඩලයේ හිඟයක් සංවිධානයේ පවතින බවයි. එම නිසා සංවිධානය මාණ්ඩලික නිලධාරීන් වෙත අතිකාල දීමනා ගෙවීමට කටයුතු කර තිබුණු අතර එමඟින් සේවක පිරිවැටුම අවම කිරීමට සහ සංවිධානයේ ක්ෂණිකව සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉලක්ක ළඟාකර ගැනීමට ඔවුන් ධෛර්යමත් කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී රජයේ නිවාඩු දිනවල සේවය කළ මාණ්ඩලික නිලධාරීන් සඳහා නිවාඩු දින වැටුප් ලෙස එකතුව රු.මිලියන 1.14 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2013 ඔක්තෝබර් 13 දිනැති අංක 2013/21 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අවශ්‍යතාව අනුව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, 2015 මැයි 26 දිනැති අංක පීඊඩී/1/2015 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව 2015 සැප්තැම්බර් දක්වා නිවසේ සිට රාජකාරි ස්ථානයට පැමිණීමට ප්‍රවාහන පහසුකම් හිමිකම නොමැති නිලධාරීන් 03 දෙනෙකු එම පහසුකම් ලබාගෙන තිබුණි.

(ඇ) විදේශ සංචාරය සම්බන්ධ සියළුම පිරිවැය වැඩමුළුව සංවිධානය කළ ආයතනය දරා තිබුණු නමුත් 2015 මැයි 15 දිනැති අංක 01/2015/01 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 3.2 වගන්තියට පටහැනිව, 2015 ඔක්තෝබර් 04 දින සිට දෙසැම්බර් 12 දින තෙක් ජපානයේ පැවති වැඩමුළුව සඳහා සහභාගීවූ නිලධාරියා රු.171,444 ක් අනියම් දීමනාව ලෙස ලබාගෙන තිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සංවිධානයේ මෙහෙයුම් වලින් ජනිත වූ ප්‍රතිඵලය රු.මිලියන 53.55 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 62.75 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 9.20 ක පිරිහීමක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් වියදම් රු.මිලියන 5.28 කින් වැඩිවීම සහ ආදායම රු.මිලියන 3.92 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් දායක වූ කරුණු විය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා සහ ඉකුත් වර්ෂය සඳහා පිළිවෙලින් එකතුව රු.මිලියන 234.64 ක් හා රු.මිලියන 188.20 ක වැටුප්, ක්ෂයවීම් සහ රජයට ගෙවූ

බදු එකතු කළ පසු සමාලෝචිත වර්ෂය සඳහා සහ ඉකුත් වර්ෂය සඳහා ඉහත සඳහන් කළ මූලා ප්‍රතිඵල පිළිවෙලින් රු.මිලියන 288.19 ක් හා රු.මිලියන 250.97 ක වාසිදායක තත්ත්වයක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 4.1 කාර්ය සාධනය

---------------

ආරක්ෂිත පරිසරයක් ගොඩනැඟීමේ සඳහා ආපදා අවදානම් අවම කිරීමට සහ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු දිරිමත් කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබාදීම සංවිධානයේ ප්‍රධාන අරමුණ වේ. සංවිධානය විසින් මෙම අරමුණු අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළදී විගණනයට නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) නායයෑම් අවදානම් තක්සේරු වාර්තා පිළිබඳ ගැටළු

--------------------------------------------------

විගණනයේදී ලැබුණු තොරතුරු අනුව, නායයෑමේ අවදානම් සහිත ප්‍රදේශවල ගොඩනැඟිලි ඉදිකිරීමට බලාපොරොත්තු වන පාර්ශවයන් විසින් සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට පෙර නායයෑමේ අවදානම් තක්සේරු වාර්තා ඍජුවම සංවිධානයෙන් හෝ අදාල පළාත් පාලන ආයතන හරහා ලබාගත යුතු වේ. මෙම කාර්යය සඳහා සංවිධානය විසින් නායයෑමේ අවධානමින් පීඩාවට පත් දිස්ත්‍රික්ක 10 ක් තුළ කාර්යාල 10 ක් පිහිටුවා තිබුණි. රු. මිලියන 24 ක භාණ්ඩාගාර ප්‍රදාන  ඇතුළුව එකතුව රු.මිලියන 38.6 ක ආදායමක් සමාලෝචිත වර්ෂය තුළ එවැනි තක්සේරු වාර්තා නිකුත් කිරීම මඟින් උපයා තිබුණි.

මේ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉහත සඳහන් වාර්තා නිකුත් කිරීමෙන් ප්‍රාදේශීය සභාවෙන් අයකර ගත යුතු මුළු එකතුව රු.මිලියන 3.51 ක් අතරින් එකතුව රු.මිලියන 1.07 ක මුදලක් 2015 දෙසැම්බර් 31 දින තෙක් අයකර ගෙන නොතිබුණි. හිඟහිටි මුදල් ප්‍රාදේශීය සභාවලින් අයකර ගැනීමට පිහිටුවා තිබුණු ක්‍රමවේදය නිසි පරිදි ක්‍රියාත්මක කර නොතිබුණු බව එමඟින් නිරූපණය විය.

(ii) ලැබී තිබුණු තොරතුරු අනුව, නායයෑමේ අවදානම් සහිත ප්‍රදේශවල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු පිළිබඳ වාර්තා නිකුත් කිරීම සහ අනුමැතිය ලබාදීමේ  වැඩසටහන වර්ෂ 2011 ආරම්භ කර තිබුණු අතර එතැන් සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයදුම්පත්‍ර 45,563 ක් ලැබී තිබුණි. එයින් අයදුම්පත්‍ර 42,775 ක් පමණක් අනුමත කර තිබුණි. කෙසේ වුවද, සංවිධානය විසින් ප්‍රතික්ෂේපිත අයදුම්පත මත සිදුකරන ලද ඉදිකිරීම් පිළිබඳව සොයා බැලීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. අධ්‍යක්ෂක ජනරාල්ගේ පැහැදිලි කිරීම් අනුව, අනවසර ඉදිකිරීම් නැවැත්වීමට සහ වැරදි පාර්ශවයන්ට එරෙහිව කිසිඳු නීතිමය පියවරක් ගැනීමට සංවිධානයට අධිකාර බලයක් නොමැති අතර එලෙස කිරීමට අදාල පළාත් පාලන ආයතනය වලට අධිකාර බලයක් තිබෙන බවය. කෙසේ වුවද, සංවිධානය ව්‍යවසන සිතියම්වල ප්‍රතික්ෂේපිත අයදුම්පත්‍රවල පිහිටීම සලකුණු කිරීමට සහ ප්‍රතික්ෂේපිත අයදුම්පත්‍ර පිළිබඳව ලේඛනයක් පවත්වා ගැනීමට පියවර ගෙන තිබුණි.

#### (ආ) නායයෑමේ අවදානම් අවම කිරීමේ කටයුතු

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) **ගැරඬිඇල්ල නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය**

---

නායයෑමේ වැඩි අවදානමකට මුහුණු දෙන නිවාස 50 ක් ඉන් මුදාගැනීම, පස් පිරවීම සහ සමහර ප්‍රදේශවලට අප ද්‍රව්‍ය ගලා ඒම වැලැක්වීමට බැම්මක් ඉදිකිරීම සහ ප්‍රධාන මාර්ග කිහිපයක් ප්‍රතිසංස්කරණය කිරීම වැනි කටයුතු මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2012 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර 2015 වර්ෂයේදී නිමකිරීමට අපේක්ෂා කර තිබුණි. මූලික ඇස්තමේන්තුවට අනුව පිරිවැය රු.මිලියන 93.01 පිරිවැය සහිත වැඩ, සමාලෝචිත වර්ෂය තුළ සිදුකිරීමට අපේක්ෂා කළ නමුත්, සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 35.50 ක පිරිවැයක් සහිත වැඩ පමණක් ඉටුකර තිබුණි. එයින් සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.මිලියන 11.90 ක වටිනා වැඩ පමණක් නිමකර තිබුණි. තවද, මෙම ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත් වැඩ කඩිනම් කිරීමට 2015 නොවැම්බර් 09 දින නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් විසින් ඉල්ලීමක් කර තිබුණු බව නිරීක්ෂණය විය. සංවිධානයේ අධ්‍යක්ෂක ජනරාල්ගේ පැහැදිළි කිරීම අනුව, අනපේක්ෂිත භූගෝලීය විෂමතා සහිත වර්ෂාපතනය අධික ප්‍රදේශයක වැඩබිම පිහිටා තිබුණු නිසා ජල ප්‍රවාහන පද්ධතිය ඉදිකිරීමේ කටයුතු ප්‍රමාදයක් පෙන්වීය. අවදානම් අවම කිරීමේ කාලය තුළ වැඩබිම භූමිය සංචලනයන්ට භාජනය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස සැලසුම්, ඉදිකිරීම් උපලේඛන සහ ඒ මත පිරිවැය ඇස්තමේන්තු වෙනස් කරන ලදි. කෙසේ වුවද, 2016 අගෝස්තු අවසාන වන විට අවදානම් අවම කරන වැඩ නිම කිරීමට අපේක්ෂා කර තිබුණි.

(ii) **පෑෂන්වත්ත ප්‍රදේශයේ නායයෑම අවම කිරීමේ ව්‍යාපෘතිය**

---

ඉහත සඳහන් ව්‍යාපෘතිය යටතේ නායයෑමේ අවම කිරීමේ වැඩ 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු අතර 2015 ජූලි මස එහි පළමු අදියර නිමකර තිබුණි. ව්‍යාපෘතියේ දෙවන අදියර 2016 ජනවාරි 31 දින නිමකිරීමට එකඟවී තිබුණු අතර 2016 ජුනි 30 දින වන විටත් නිමකර නොතිබුණි. ප්‍රදේශය තුළ පැවති අයහපත් දේශගුණික තත්ත්වය, යන්ත්‍රෝපකරණ සහ අමු ද්‍රව්‍ය ප්‍රවාහනයේදී ඇතිවූ බාධාක සහ ශ්‍රමබලකායේ පැවති හිඟයේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ II අදියර මන්දගාමී ප්‍රගතියක් නිරූපනය වූ බව අධ්‍යක්ෂක ජනරාල් පැහැදිළි කර තිබුණි.

(ඇ) **පාසල් තුළ ක්‍රියාත්මක කළ නායයෑමේ අවම කිරීමේ ව්‍යාපෘති**

---

නායයෑමේ අවම කිරීමේ ඉදිකිරීම් වැඩ නිම කිරීමට අපේක්ෂිත වූ පාසල් 14 ක් අතරින් වතු කන්ද මහා විද්‍යාලය, උඩ ගම්පිටිය මහා විද්‍යාලය, ඕවිටිගම මහා විද්‍යාලය සහ දික්වැල්ල විජිත මහා විද්‍යාලයේ ඉදිකිරීමේ වැඩ සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිම කර නොතිබුණි. එයට අමතර වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් 18 ක නායයෑමේ අවමකරණ කටයුතු සඳහා උපදේශක සේවා සැපයීමට සංවිධානය ගිවිසුමකට එළඹී තිබුණි. එයින් සමාලෝචිත වර්ෂය තුළදී කොන්ත්‍රාත් පැකේජ 2 ක් යටතේ පාසල් 04 ක ඉදිකිරීම් වැඩ ආරම්භ කර තිබුණු අතර 2015 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සහ ලංසු ඇගයීම ඇතුළු උපදේශක සේවා අසම්පූර්ණව පැවතුණි.

(ඈ) **දේශගුණික අවබලපෑම් අවම කිරීම් වැඩිදියුණු කිරීම**

---

මහනුවර මහියංගනය මාර්ගයේ ස්ථාන 16 ක අස්ථාවර බෑවුම් නායයෑම් අවම කිරීම සඳහා උපදේශක සේවා සැපයීමට සංවිධානය ගිවිසුමකට එළඹ තිබුණි. ලැබී තිබුණු තොරතුරු

අනුව, මාර්ගයේ ස්ථාන කිහිපයක භෞතික ප්‍රගතිය සියයට 4.2 ක් පමණක් පැවතුණු නමුත් අපේක්ෂිත ඉලක්කය සියයට 75 ක් වූ අතර එහි කටයුතු 2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට නියමිතව තිබුණි.

## 4.2 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සංවිධානයේ මූලස්ථාන ගොඩනැඟිල්ල රු.මිලියන 350 ක ඇස්තමේන්තුගත මුළු පිරිවැයකට ඉදිකිරීමට පියවර ගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 100 ක ප්‍රාග්ධන ප්‍රදාන භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිකිරීම් කටයුතු සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 350 ක් වුවත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් සහ තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබුණි. රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය යටතේ පිරිවැය රු.මිලියන 45.28 ක බිම විදීම වැඩ සඳහා 2015 දෙසැම්බර් 29 දින කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි.

(ii) 2016 මාර්තු 29 දින ආරම්භ කළ බිම විදීම් වැඩ 2016 ජූනි 30 දින තෙක් සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව 2015 දෙසැම්බර් 30 දින රු.මිලියන 8.12 ක මුදලක සංචලන අත්තිකාරම් ගෙවා තිබුණි. බිම විදීම් වැඩ ආරම්භ නොකිරීම හේතුවෙන් සංචලන අත්තිකාරම් මාස 3 ක් පුරා නොපියවා කොන්ත්‍රාත්කරු රඳවා ගෙන තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) මෝටර් වාහන 3 ක් බැහැර කිරීමේදී ඒ සඳහා බාහිර පාර්ශවයන් විසින් තක්සේරු කර තිබුණු අතර ලංසු ඉදිරිපත් කිරීම සඳහා දින 08 ක් පමණ ප්‍රමාණවත් නොවන කාලපරිච්ඡේදයක් ලබාදී තිබුණු හෙයින් සංවිධානය අනුගමනය කළ පිළිවෙත විනිවිදභාවයකින් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

විද්‍යාඥ තනතුරු සඳහා ඉකුත් වර්ෂය අවසාන දිනට පැවති පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂය තුළදී පුද්ගලයින් 35 දෙනෙකු බඳවා ගත් නමුත්, කළමනාකරණසේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් සහ පැවරුම් පදනම මත පුද්ගලයින් 31 දෙනෙකු දැනටමත් සේවයේ නියුතුවී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

------------------------------------

## 5.1 ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය පිහිටුවීම

------------------------------------------------

ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ පාංශු පර්යේෂණ විද්‍යාගාරය යනාදි වෙනත් ආයතන සතු කාර්යයන් ක්‍රියාත්මක කිරීමට වෙනනම ආයතනයක් පිහිටුවීමේ අරමුණින්, 1993 සැප්තැම්බර් 29 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව මෙම සංවිධානය පිහිටුවා තිබුණි. සංවිධානය පාර්ලිමේන්තු පනතක් යටතේ සංස්ථාපනය කර

නොතිබුණු හෙයින්, සංවිධානය විසින් ඉදිකිරීම් කටයුතු සඳහා නිකුත් කළ සහතික වල වලංගු භාවය පිළිබඳව ගැටළුකාරී විය. තවද, අවදානම් සහිත ප්‍රදේශවල ඉදිකිරීම් කටයුතුවලට සම්බන්ධ පුද්ගලයින්ට එරෙහිව සංවිධානය විසින් සිදුකළ යුතු පසුවිපරම් කටයුතු සඳහා පවතින අවස්ථා බොහෝ සීමිත විය.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සංවිධානයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැලසුම් කළ භෞතික ඉලක්ක අත්පත් කර ගැනීමට නොව මූල්‍ය ඉලක්ක පමණක් අත්පත් කර ගැනීමට සකස් කර තිබුණු බව නිරීක්ෂණය විය. එබැවින්, නායයෑම් අවමකරණයට ආපදා අවදානම් කලාප සිතියම්කරණය සහ සිදුකළ කොන්ත්‍රාත් වැඩ සම්බන්ධයෙන් භෞතික කාර්යය සාධනය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය.

### 5.3 අභ්‍යන්තර විගණනය

සංවිධානයේ අභ්‍යන්තර විගණන අංශය එක් නිලධාරියකුගෙන් පමණක් සමන්විතවී තිබූ අතර සංවිධානය විසින් විවිධ කටයුතු වෙනුවෙන් සිදුකරන ලද ගෙවීම්, භෞතික කාර්ය සාධනය අත්පත් කර ගැනීමේ ප්‍රගතිය යනාදිය අභ්‍යන්තර විගණන අංශය විසින් පරීක්ෂා කර නොතිබුණි.

### 5.4 මතභේදයට තුඩුදෙන කරුණු

1971 අංක 38 දරන මුදල් පනතේ 11(බී) වගන්තිය සහ 2011 ජනවාරි 27 දිනැති පීඊඩී 56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනිව සංවිධානය එහි අතිරික්ත අරමුදල් රු.මිලියන 149.24 ක මුදලක් ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය.

### 5.5 අයවැය පාලනය

අයවැයගත සහ තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය සඳහා මූල්‍ය ඉලක්ක, ආදායම් සහ වියදම් ඉලක්ක තීරණය කිරීමේදී ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එබැවින්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන්ගේ අඩුපාඩු සංවිධානයේ අධ්‍යක්ෂක ජනරාල්ගේ අවධානයට වරින් වර යොමු කරන ලදි. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි කළමනාකරණයේ විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | මෙහෙයුම් ක්ෂේත්‍රයන් | පොදු අඩුපාඩු |
|---|---|---|
| (අ) | ණයගැතියන් පිළිබඳ පාලනය | දිගු කාලීන හිඟහිටි ශේෂයන් පිළිබඳව පසු විපරම් කටයුතු |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු පිරවීම |
| (ඇ) | ව්‍යාපෘති කළමනාකරණය | ව්‍යාපෘති කටයුතු ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කිරීම. |